www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**6 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය: 8 - සුව පහසු දිවියක් සඳහා විදුලිය**

Agaram.LK - Keep your dreams alive!

(1) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ලෙස විදුලිය නිපදවනු ලබන්නේ,
1) ජලයේ ශක්තිය යොදාගෙනය. 2) ගල් අඟුරු වල ශක්තිය යොදාගෙනය.
3) න්‍යෂ්ටික ශක්තිය යොදාගෙනය. 4) සුළගේ ශක්තිය යොදාගෙනය.

(2) ශ්‍රී ලංකාවේ සුළං විදුලි බලාගාරයක් පිහිටා ඇත්තේ,
1) කොත්මලේය. 2) හම්බන්තොටය.
3) නොරොච්චෝලේය. 4) කැලණිතිස්සය.

(3) ජල විදුලි බලය නිෂ්පාදනය කළ හැකි බව ශ්‍රී ලංකාවට මුලින්ම හඳුන්වා දුන්නේ,
1) විමල සුරේන්ද්‍ර මහතා ය. 2) රොබට් නොක්ස් ය.
3) හම්ප්‍රිඩේවි මහතා ය. 4) රොබට් විට්ටේකර් ය.

(4) සරල කෝෂය නිර්මාණයට අවශ්‍ය ලෝහ වර්ග 2 නම්,
1) කොපර්, සින්ක් ය. 2) යකඩ, ඇලුමිනියම් ය.
3) යකඩ, සිල්වර් ය. 4) කොපර්, යකඩ ය.

(5) ඩයෝඩයේ සම්මත සංකේතය,

1)  2) 

3)  4) 

(6) ආලෝක විමෝචක ඩයෝඩයේ සංකේතය,

1)  2) 

3)  4) 

(7) ආලෝක සංවේදී ප්‍රතිරෝධකයේ සංකේතය,

1)  2) 

3)  4) 

(8) විද්‍යුත් සන්නායකයක් නොවන්නේ,
1) තඹ 2) මයිකා 3) ඇලුමිනියම් 4) රිදී

(9) ප්‍රතිරෝධය මනින ඒකකය,
1) ඕම් ය. 2) ඇම්පියර් ය. 3) වෝල්ට් ය. 4) කූලෝම්

Agaram.LK - Keep your dreams alive!

(10) ඩයෝඩයේ ප්‍රධාන කාර්යය වන්නේ,
1) විදුලි ධාරාව අඩු කිරීමය.
2) පරිපථයේ ප්‍රතිරෝධය වැඩි කිරීමයි.
3) විදුලි ධාරාව එක් දිශාවකට පමණක් ගැලීමට සැලැස්වීමයි.
4) විදුලි ධාරාව මනින උපකරණයයි.

- **යා කරන්න.**

(1)

| | |
|---|---|
| a) විදුලිය ගමන් කරන ද්‍රව්‍ය | ප්‍රතිරෝධය |
| b) විදුලිය නොගලන ද්‍රව්‍ය | ඇමීටරය |
| c) ඉතා කුඩා විදුලි ධාරා මනින්නේ | මිලි ඇමීටරය |
| d) විදුලි ධාරාව මනින උපකරණයකි | පරිවාරක |
| e) පරිපථයක විද්‍යුත් ධාරව ගමන් කිරීමට ඇති වන බාධාව | සන්නායක |

(2) විද්‍යාගාරයේ දී නිර්මාණය කළ සරල කෝෂයක රූප සටහනක් පහත දක්වේ.



i) එහි ස්විචය වැසූ විට දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න.
ii) සරල කෝෂයේ දුර්වලතාවක් ලියන්න.
iii) රසායනික කෝෂ බෙදිය හැකි ආකාර 2 නම් කරන්න.
iv) ඒවාට උදාහරණ ලියන්න.

(3) i) විදුලිය නිපදවිය හැකි බහුලව භාවිතා කරන ක්‍රම 3 ලියන්න.
ii) A හා B රූපසටහනකින් දක්වෙන උපකරණ හඳුනා ගන්න.




iii) වියළි කෝෂයක්, ස්විචයක්, ඇමීටරයක්, බල්බයක්, සම්බන්ධ කරන ආකාරය පරිපථ රූප සටහනකින් ඇඳ දක්වන්න.

(4) i) ආලෝක සංවේදී ප්‍රතිරෝධකය මතට ආලෝකය වැටුන විට පරිපථයේ බල්බයේ දීප්තියට කුමක් සිදුවේද?



ii) ඔබ දන්නා වෙනත් ප්‍රතිරෝධක වර්ග 2 ක් ලියන්න.

iii)



ඉහත පරිපථයේ බල්බ දෙක සම්බන්ධ කර ඇති ආකාරය හැඳින්වෙන නම කුමක් ද?

(5) i) ඔබට ගැල්වනෝමීටරයක්, යෝගට් හැඳි, මෝටරයක්, කිරල ඇබයක් සපයා ඇත්නම් එය සම්බන්ධ කර කුඩා විදුලි බලාගාරයක ආකෘතියක් ඇඳ දක්වන්න.
ii) විදුලි ශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට ඔබට දායක විය හැකි ආකාර 3 ක් ලියන්න.
iii) විදුලි අනතුරු වලක්වා ගැනීමට කල හැකි දේවල් 3 ක් ලියන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!